අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/01/16/04/02/02 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.06. 04 |

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>පාසල් පරිශ්‍රවල ඩෙංගු සහ චිකුන්ගුන්යා රෝග නිවාරණය සඳහා කටයුතු සිදු කිරීම.</u>**

මෝසම් වැසි සමය එළඹීමත් සමඟ දිවයින පුරා ඩෙංගු රෝගය සහ චිකුන්ගුන්යා රෝග පැතිර යාමේ දැඩි අවදානමක් පවතින බවත්, 2025 මැයි 31 වැනි දින දක්වා දිවයිනේ විවිධ ප්‍රදේශවලින් වාර්තා වූ ඩෙංගු රෝගීන් අතරින් ඉහළ ප්‍රතිශතයක් වයස අවුරුදු 5 ත් 19 ත් අතර පාසල් වයසේ පසු වන දරුවන් බවත් සෞඛ්‍ය අංශ මගින් දැනුවත් කර ඇත.

02. එබැවින් පාසල් ආශ්‍රිත පරිසරය මදුරුවන්ගෙන් තොර ව ආරක්ෂිත ව පවත්වාගෙන යාම සඳහා මීට පෙර නිකුත් කර ඇති 2010/22 හා 30/2017 චක්‍රලේඛ හා උපදෙස් ලිපිවලට අමතර ව මෙහි සඳහන් ක්‍රියා මාර්ග හා උපදෙස් නිකුත් කරන අතර සිසු දරුවන් හා අධ්‍යයන / අනධ්‍යයන කාර්ය මණ්ඩලවල සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් පහත සඳහන් උපදෙස් පිළිපදින ලෙස කාරුණික ව දන්වමි.

i. සියලු පාසල් පරිශ්‍ර මදුරුවන් බෝ නොවන ලෙස පවත්වාගෙන යාම සඳහා පාසල් අධ්‍යයන කටයුතුවලට බාධාවක් නොවන පරිදි පාසල් මඟින් සුදුසු අභ්‍යන්තර වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීම .

ii. පාසල් පරිශ්‍ර පිරිසිදු කිරීමේ දී හඳුනාගනු ලබන අවදානම් සහිත ස්ථාන පවිත්‍ර කිරීම සඳහා සහ උපකාර අවශ්‍ය අනෙකුත් කටයුතු සඳහා පළාත් පාලන ආයතන, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ආදි අංශවල නිලධාරීන්ගේ සහාය ලබා ගැනීම.

iii. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු හා ඩෙංගු මර්දන කමිටු සක්‍රිය කර, පිරිසිදු කිරීම් කටයුතු සඳහා සනීපාරක්ෂක කම්කරු / පාසල් කම්කරු / උද්‍යාන කම්කරු යන අනධ්‍යයන කාර්ය මණ්ඩල වෙත වගකීම් පැවරීම. ඊට අමතර ව මේ සඳහා පාසල් සංවර්ධන සමිති, ආදි ශිෂ්‍ය සංගම් හා දෙමාපිය සහාය ද ලබා ගත හැකි ය.

iv. සිසු දරුවන් හා කාර්ය මණ්ඩල ප්ලාස්ටික් / පොලිතින් ආදි නොදිරන අපද්‍රව්‍ය පාසල තුළට රැගෙන නොඑන ලෙස දැනුවත් කිරීම හා පාසල තුළ එක්රැස් වන ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම හා නිසි පරිදි බැහැර කිරීමට ක්‍රමවේද සකස් කර ගැනීම.

v. පාසල් තුළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය තුළින් හඳුනාගත් ඉවත් කළ යුතු / විනාශ කළ යුතු / කැඩී ගිය ද්‍රව්‍ය හැකි ඉක්මනින් හා නිසි පරිදි ඉවත් කිරීමට / විනාශ කිරීමට කටයුතු කිරීම.

vi. පාසලේ සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 02/2019 ට අනුව සක්‍රිය ව පවත්වාගෙන යාම සහ කමිටුව යාවත්කාලීන කිරීම.

vii. සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු රැස්වීම් නියමිත ලෙස පවත්වමින් පාසලේ ශිෂ්‍ය ප්‍රජාවගේ සෞඛ්‍යය, සනීපාරක්ෂාව සහ ඩෙංගු හා චිකුන්ගුන්යා රෝග ව්‍යාප්තිය පාලනය පිළිබඳ ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම හා ඇගයීම.

viii. පාසල් පරිශ්‍ර තුළ අඩක් නිම කළ ගොඩනැගිලි, වහල නොමැති ස්ලැබ් ආදි ජලය එක් රැස්වන ස්ථාන පිළිබඳ ව නිරන්තර අවධානය යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමා ව ගැනීම.

ix. සියලු ම සිසු දරුවන් ඩෙංගු රෝගය /චිකුන්ගුන්යා රෝගය පිළිබඳ විශේෂයෙන් දැනුවත් කිරීම සහ පාසල් මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කර නිවෙස් ආශ්‍රිත පරිසර ද ඩෙංගු මදුරුවන්ගෙන් තොර ව ආරක්ෂිත ව පවත්වාගෙන යාමට දිරිගැන්වීම.

x. පාසල් කාලය තුළ මදුරු දෂ්ටනය අවම කිරීම සඳහා මදුරු විකර්ශක ආලේපයට හා අත් පා ආවරණය වන පරිදි සුදුසු ඇඳුම් ඇඳීමට සිසුන් දැනුවත් කිරීම.

03. ඩෙංගු හා චිකුන්ගුන්යා රෝග වාහක මදුරුවන් බෝවන ස්ථාන හඳුනා ගැනීම සඳහා නිරන්තර ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කෙරෙන බැවින් යම් හෙයකින් පාසල් පරිශ්‍ර තුළ එවැනි ස්ථාන හඳුනාගනු ලැබුවහොත් විදුහල්පති පෞද්ගලික ව ම වගකීමට බැඳෙන බවත්, නීතිමය ක්‍රියාමාර්ගවලට මුහුණ දීමට සිදුවනු ඇති බවත් අවධාරණය කෙරේ.

04. ඒ අනු ඔබ පළාතේ ජාතික පාසල් ද ඇතුළත් ව සියලු ම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්, පිරිවෙන්වල පරිවේනාධිපතිවරුන්, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පීඨාධිපතිවරුන් සහ පළාතේ අනෙකුත් අධ්‍යාපන මධ්‍යස්ථාන හා කාර්යාල ප්‍රධානීන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් වැඩිදුරටත් කාරුණික ව දන්වමි.

05. ජාතික හා කාලීන අවශ්‍යතාවක් වන මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අතිශය අගය කරමි.

නාලක කළුවැව

ලේකම්

පිටපත්-

01. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
02. සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
03. ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), අධ්‍යාපන අමාත්‍යාංශය
04. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්), අධ්‍යාපන අමාත්‍යාංශය
05. අධ්‍යක්ෂ, ජාතික ඩෙංගු මර්දන ඒකකය

(01–05) - කරු. දැ.ගැ.ස.

06. පළාත් සෞඛ්‍ය ප්‍රවර්ධන සම්බන්ධීකරණ නිලධාරී - කරු. අ.ක.ස.